“කවරෙකු අල්ලාහ්ගේ මාර්ගයේ නිරතව දිනක් උපවාසය රැක්කේ ද අල්ලාහ් ඔහුගේ මුහුණ අපා ගින්නෙන් වසර හැත්තෑවක් දුරස් කරනු ඇත.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයට තමන් සවන් දුන් බව පවසමින් අබූ සඊද් අල් කුද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “කවරෙකු අල්ලාහ්ගේ මාර්ගයේ නිරතව දිනක් උපවාසය රැක්කේ ද අල්ලාහ් ඔහුගේ මුහුණ
අපා ගින්නෙන් වසර හැත්තෑවක් දුරස් කරනු ඇත.” [صحيح] [متفق عليه]

"අල්ලාහ්ගේ මාර්ගයේ අරගල කරන අතරවාරයේ කවරෙකු දිනක් උපවාසයේ නිරත වූයේ ද, තවත් වාර්තාවක අල්ලාහ්ගේ මාර්ගයේ හෝ වෙනත් කටයුත්තක අවංකභාවයෙන් යුතුව අල්ලාහ්ගෙන් කුසල් හා ප්රතිඵල බලාපොරොත්තුවෙන් උපවාසයේ නිරත වූයේ ද, එවිට සැබැවින්ම අල්ලාහ් තම භාග්යය තුළින් ඔහු හා අපා ගින්න අතර වසර හැත්තෑවක දුර ප්රමාණයක් දුරස් කරනු ඇත" යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ.

http://www.sunnah.global/hadeeth/si/show/4436